# සාමාන්‍ය කලා උපාධිය (බාහිර) 2016 අගෝස්තු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය 1

( WCCG1 ) නව නිර්දේශය

**ග්‍රීක සාහිත්‍ය සහ සාහිත්‍ය සිද්ධාන්ත**

කාලය පැය තුනයි

මෙම ප්‍රශ්ණ පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්ණ සංඛ්‍යාව 12 කි.

---

**පළමු ප්‍රශ්ණයටත් එක කොටසකින් අඩුම තරමේ එක ප්‍රශ්ණය බැගින් තෝරා ගනිමින් තවත් ප්‍රශ්ණ හතරකටත් පිලිතුරු සපයන්න**

1. පහත දැක්වෙන උද්ධෘත පාඨ අතරින් ඕනෑම හතරක අවස්ථා සම්බන්ධය දක්වමින් ඒවායේ අන්තර්ගතය පිළිබඳව විග්‍රහ කරන්න..

උද්ධෘත පාඨ සඳහා ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රශ්ණ පත්‍රය බලන්න .

**පළමු කොටස- සාහිත්‍යය**

2. 'ඇගමෙම්නොන් අත්විදි දෙයට වගකිව යුත්තේ අන් කිසිවකු නොව ඔහුම වේ.' මෙම කියමන සම්බන්ධයෙන් ඊස්කිලස්ගේ **ඇගමෙම්නොන්** නාට්‍යය ඇසුරින් කරුණු දක්වන්න.

3. සොෆොක්ලිස් ඔහුගේ **ඊඩිපස් රජ** නාට්‍යයේ ඊඩිපස් සහ ජොකැස්ටා යන චරිතවලට කාවද්දන මානසික ආරවුල පිළිබඳව සාකච්ඡා කරන්න.

4. 'යුරිපිඩීස් වෙනත් පැරණි නාට්‍යය රචකයෙකුට වඩා කාන්තාවන් ගැන හොඳින් අවබෝධ කර ගත්තෙකි.' ඔබ මෙම කියමන සමග එකග වන්නේද? යුරිපිඩීස්ගේ **හිපොලිටස්** නාට්‍යයේ එන ෆීඩ්‍රාගේ චරිතය ඇසුරින් හේතු දක්වන්න.

5. ඇරිස්ටොෆනීස්ගේ **ෆ්රොග්ස්** නාට්‍යයේ එන ඊස්කිලස් සහ යුරිපිඩීස් අතර සිදු වන කාව්‍ය තරගය සාහිත්‍ය විචාරයක් ලෙසින් ගෙන විමසන්න.

6. හෙරඩෝටස්ගේ **ඉතිහාසය** යන කෘතියේ ඇති කුමන ලක්ෂණයන් හෙරඩෝටස්ව ඉතිහාසඥයෙක් ලෙසින් හැඳින්වීමට එරෙහිව නැගී සිටින්නේද? සාකච්ඡා කරන්න.

7. තුසිඩිඩීස් කල්පනාකාරී ඉතිහාසඥයෙක් ලෙසින් ඔබ දකින්නේද? ඔබේ හේතු දක්වන්න.

8. ප්ලේටෝගේ **මධුසාදය** කෘතියේ ඇගතොන්, ඇලිසිබියාඩීස් සහ ඇරිස්ටොෆනීස් යන චරිත සොක්‍රටීස්ගේ චරිතය සහ පෞරුෂය නිරූපණයේදී කෙසේ දායක වන්නේදැයි සාකච්ඡා කරන්න.

## දෙවන කොටස- සාහිත්‍යය සිද්ධාන්ත

9. හෝමර් තම ඉලියඩ් සහ ඔඩිසි යන වීර කාව්‍යන් තුල ඇතුලත් කළ කාව්‍යමය ශෛලයන් පැහැදිලි කරන්න.

10. 'කවියාගේ වර්තනාකම සම්බන්ධයෙන් ප්ලේටෝ දක්වන පරස්පර විරෝධී අදහස් මෙම කරුණ පිළිබඳව ඔහුගේ ව්‍යාකුලත්වය එළි කරයි.' ප්ලේටෝගේ **ජනරජය** කෘතියේ කවියා ගුරුවරයෙක් ලෙසින් දැකීම ඇසුරින් මෙම කියමන පිළිබඳව අදහස් දක්වන්න.

11. ඇරිස්ටොටල්ට කිව්‍යය යනු 'අනුකරණ මාධ්‍යයකි.' ඇරිස්ටොටල්ගේ ද **පොයටික්ස්** ග්‍රන්ථය ඇසුරින් මේ පිළිබඳව අදහස් දක්වන්න.

12. සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් ඩිමිට්‍රියස්ගේ දායකත්වය සාකච්ඡා කරන්න.

# සාමාන්‍ය කලා උපාධිය (බාහිර) 2016 අගෝස්තු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය 1

( WCCG1 ) පැරණි නිර්දේශය

**ග්‍රීක සාහිත්‍ය සහ සාහිත්‍ය සිද්ධාන්ත**

කාලය පැය තුනයි

මෙම ප්‍රශ්ණ පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්ණ සංඛ්‍යාව 12 කි.

---

**පලමු ප්‍රශ්ණයටත් දෙවන කොටසින් අඩුම තරමේ එක ප්‍රශ්ණයක් ද ඇතුලුව තවත් ප්‍රශ්ණ හතරකටත් පිලිතුරු සපයන්න**

1. පහත දැක්වෙන උධෘතපාඨ වලින් ඕනෑම හතරක් තෝරා ගෙන

උධෘතපාඨ සඳහා ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රශ්ණ පත්‍රය බලන්න.

## පළමු කොටස - සාහිත්‍ය

2. "ඊස්කිලස්ගේ *ද ලයිබේෂන් බෙයාරස්* නාට්‍යයේ සාධාරණය සහ පළි ගැනීම යන තේමාවන් සමීපව එකිනෙක හා බැඳී පවතී." මෙම කියමන සමඟ ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න.

3. **එක්කෝ**

(i) "සොෆොක්ලීස්ගේ **ඊඩිපස් රජ** නාට්‍යය යමෙකුට තම දෛවයෙන් බේරි යෑම කළ නොහැක්කක් බව මනාව නිරූපණය කරයි." සාකච්ඡා කරන්න.

**නැතහොත්**

(ii) සොෆොක්ලීස්ගේ **කොලෝනස්හි ඊඩිපස්** නාට්‍යයේ තේමාවන් සාකච්ඡා කරන්න.

4. **මීඩියා** නාට්‍යයේ යුරිපිඩීස් මීඩියාගේ චරිතය නිරූපණය කරන ආකාරයට වඩා හොඳින් එම නිරූපණය සිදු විය යුතු යැයි ඔබ සිතන්නේද? හේතු දක්වන්න.

5. **එක්කෝ**

(i) ''ඇරිස්ටොෆනීස්ගේ **වලාකුළු** නාට්‍යය විතණ්ඩවාදී ඉගැන්වීම් ගැරහීමකට ලක් කිරීමකි.'' මෙම වාක්‍ය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

**නැතහොත්**

(ii) ඇරිස්ටොෆනීස්ගේ ද **එසෙම්බ්ලි ඔෆ් විමෙන්** නොහොත් **කාන්තාවන්ගේ රැස්වීම** යන ප්‍රහසනය නාට්‍යයක් පමණක්ම නොවේ. එහි ඉතා සංකීර්ණ අප්‍රකාශිත හැඟීමක් ගැබ්ව ඇත. සාකච්ඡා කරන්න.

6. මිනැන්ඩර්ගේ **සේමියානු කාන්තාව** යන නාට්‍යයේ දැක්වෙන නව ප්‍රහසනයක දැකිය හැකි වැදගත් ලක්ෂණ විමර්ශනය කරන්න.

7. **පෙලොපොනීසියානු යුද්ධය** යන කෘතිය ලිවීමේදී තුසිඩිඩීස් යොදා ගත් ඉතිහාසය රචනා කිරීමේදී අවශ්‍ය වන විද්‍යාත්මක ක්‍රමයන් මොනවාද? ඒවා හෙරඩෝටස්ගේ **ඉතිහාසය** යන කෘතියේ දැකිය හැකි ක්‍රම වලින් වෙනස් වන්නේ කෙසේද? සාකච්ඡා කරන්න.

8. ''ප්ලේටෝගේ **මධුසාදය** කෘතියේ සොක්‍රටීස්ව නිරූපණය කර ඇත්තේ අසාමාන්‍ය පුද්ගලයෙකු ලෙසිනි.'' මෙම කෘතියෙන් අදාළ නිදසුන් ගෙන දක්වමින් මෙම සඳහන් ගැන ඔබේ අදහස් දක්වන්න.

## දෙවන කොටස- සාහිත්‍යය සිද්ධාන්ත

9. හිසියඩ්ගේ කාව්‍යන්ගේ දැක්වෙන පරිදි කාව්‍යමය හැකියාව, කාව්‍යමය අත්දැකීම්වල සොභාවය සහ කවියාගේ තත්ත්වය පිළිබඳව විමසන්න.

10. තරුණ ආරක්ෂකයින්ගේ ගුරුවරුන් ලෙසට කවියන්හට ප්ලේටෝ ලබා දෙන වටිනාකම පරමාදර්ශී රාජ්‍යයක් පිහිටු වීම ඇසුරින් සාකච්ඡා කරන්න.

11. හොඳ / සාර්ථක ශෝකාන්ත නාට්‍යයක තිබිය යුතු ලක්ෂණ ඇරිස්ටොටල්ගේ ද **පොයටික්ස්** ග්‍රන්ථය ඇසුරින් සාකච්ඡා කරන්න.

12. ලොන්ජයිනස් පවසන අන්දමට යහපත් ශෛලයයකට හාත් පමුණුවන ප්‍රධාන ගුණයන් මොනවාද? සාකච්ඡා කරන්න.

## සාමාන්‍ය කලා උපාධිය (බාහිර) 2016 අගෝස්තු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය 2

( WCCG2 ) නව නිර්දේශය

**රෝම සාහිත්‍ය සහ සාහිත්‍ය සිද්ධාන්ත**

කාලය පැය තුනයි

මෙම ප්‍රශ්ණ පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්ණ සංඛ්‍යාව 10 කි.

---

**පළමු ප්‍රශ්ණයටත් එක කොටසකින් අඩුම තරමේ එක ප්‍රශ්ණය බැගින් තෝරා ගනිමින් තවත් ප්‍රශ්ණ හතරකටත් පිළිතුරු සපයන්න**

1. පහත දැක්වෙන උද්ධෘත පාඨ අතරින් ඕනෑම හතරක අවස්ථා සම්බන්ධය දක්වමින් ඒවායේ අන්තර්ගතය පිළිබඳව විග්‍රහ කරන්න..

උද්ධෘත පාඨ සඳහා ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රශ්ණ පත්‍රය බලන්න .

**පළමු කොටස- සාහිත්‍යය**

2. ප්ලෝටස් තම ඇම්ෆිට්‍රියෝ නාට්‍යයේ හාස්‍ය උත්පාදනය සඳහා එහි චරිත යොදා ගන්නා ආකාරය විමසීමට ලක් කරන්න.

3. මිනිසුන් බියෙන් මුදවා ගැනීමේ අභිප්‍රාය බටු කර ගැනීමට ලුක්‍රීෂස් තම **ද නේචර් ඔෆ් ද යුනිවර්ස්** කෘතියේ කුමන උත්සාහයක් දරන්නේදැයි සාකච්ඡා කරන්න.

4. 'වර්ජිල් තම එක්ලොග්ස් කෘතියේ ගොවියකු ගත කරන නියම ජීවිතය නිරූපණය කරයි.' ඔබ මෙම කියමන හා එකග වන්නේද? ඒ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

5. ඉතිහාසඥයෙක් ලෙසින් ඔබ ටැසිටස්ව අගයන්නේ කෙසේද? ඔහුගේ ඇනල්ස් කෘතියෙන් සුදුසු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

6. සෙනෙකාගේ **ඒට්‍රියස් සහ තයෙස්ටීස්** යන චරිත ඉදිරිපත් කිරීම ඉතා භයංකාර ලෙසට භය සහ ත්‍රාසය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම කෙරෙහි කෙතෙක් දුරට දායක වන්නේද? සෙනෙකාගේ **තයෙස්ටීස්** නාට්‍ය ඇසුරින් මෙය සාකච්ඡා කරන්න.

7. ජුවෙනල් තම **සැටයර් දහසය** ඔස්සේ ඔහුගේ සමකාලීන රෝම සමාජයේ පැවති ත්‍රාසය සහ අනතුරු දායක බව පිළිබඳව කෙතෙක් දුරට අපව දැනුවත් කරන්නේද? පැහැදිලි කරන්න.

## දෙවන කොටස- සාහිත්‍යය සිද්ධාන්ත

8. 'ව්‍යක්තභාවය විචචන හසුරවනවාට වඩා හැකියාවක් ලබාදෙයි.' සිසරෝගේ දෘෂ්ටිය ඇසුරින් මෙම සංකල්පය සාකච්ඡා කරන්න.

9. හොරස් කවියාට ලබාදෙන උපදෙස් ප්‍රඥාවන්ත සහ ප්‍රායෝගික ඒවා ලෙසට ඔබ දකින්නේද? ඒ ඇයි? හොරස්ගේ **ආර්ස් පොයටිකා** ඇසුරින් ඔබේ හේතු පැහැදිලි කරන්න.

10. ක්වින්ටිලියන් අධ්‍යාපනඥයෙක් ලෙසින් අගැයීමට ලක් කරන්නේ කෙසේද? සාකච්ඡා කරන්න .

සාමාන්‍ය කලා උපාධිය (බාහිර) 2016 අගෝස්තු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය 2

( WCCG2 ) පැරණි නිර්දේශය

**රෝම සාහිත්‍ය සහ සාහිත්‍ය සිද්ධාන්ත**

කාලය පැය තුනයි

මෙම ප්‍රශ්ණ පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්ණ සංඛ්‍යාව 11 කි.

---

**පලමු ප්‍රශ්ණයටත් එක කොටසකින් අඩුම තරමේ එක ප්‍රශ්ණයක්** ද ඇතුලුව **තවත් ප්‍රශ්ණ හතරකටත්** පිලිතුරු සපයන්න`

1. පහත දැක්වෙන උද්ධෘත පාඨ අතරින් ඕනෑම හතරක අවස්ථා සම්බන්ධය දක්වමින් ඒවායේ අන්තර්ගතය පිළිබඳව විග්‍රහ කරන්න..

උද්ධෘත පාඨ සඳහා ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රශ්ණ පත්‍රය බලන්න .

**පළමු කොටස- සාහිත්‍යය**

2 . ප්ලෝටස් තම **ස්වැගරිං සෝල්ජර්** නාට්‍යයේ ප්‍රහසනය ජනිත කිරීම සඳහා යොදාගන්නා උපක්‍රම පැහැදිලි කරන්න.

3. **එක්කෝ**

(i) 'යූනක් නාට්‍යය එයට සමකාලීන ඇතීනියානු සමාජයේ විසූ විවිධ චරිතයන් නිරූපණය කරයි' මෙය ටෙරන්ස් තම **යූනක්** නම් නාට්‍යයේ කිනම් අයුරකින් සිදුකරන්නේද යන්න ඇසුරින් සාකච්ඡා කරන්න .

**නැතහොත්**

(ii) **ද ගර්ල් ෆ්‍රොම් ඇන්ඩ්‍රොස්** නාට්‍යයේ ඩාවොස්ගේ චරිතයලමෙම නාට්‍යයේ කථාවස්තුව ගොඩනැංවීම සහ ප්‍රධාන චරිතවල ප්‍රවර්ධනය සඳහා කෙසේ දායක වන්නේද යන්න ඇසුරින් විමසන්න .

4. ලුක්‍රීෂස් තම **ද නේචර් ඔෆ් ද යුනිවර්ස්** කෘතියේ පෙනෙන ලෝකය මගින් නියම ලෝකය පැහැදිලි කරන අයුරු ඇගයීමකට ලක් කරන්න .

5. 'වර්ජිල්ගේ **එක්ලොග්ස්**හි නිරූපණය කරන ග්‍රාමීය ජීවිතය යථා තත්වයෙන් ඔබ්බට වූවකි.' මෙම කියමන පිළිබඳව ඔබේ අදහස් දක්වන්න .

6. 'සෙනෙකාගේ නාට්‍යය ත්‍රාසයෙන් පිරී ඇත්තේ ඔහු ශෝකාන්ත නාට්‍යය යනු ත්‍රාසය නිරූපණය කිරීමය ලෙසින් දකින නිසාය.' සෙනෙකාගේ **ෆීඩ්‍රා** හෝ **තයෙස්ටීස්** නාට්‍යය ඇසුරින් මෙම කියමන සාකච්ඡා කරන්න .

7. ජුවෙනල් තම සමකාලීන සමාජය පිළිබඳව කුමක් නිරූපනය කරන්නේද? ඔහුගේ අභිප්‍රාය සමාජයේ සිදු වන අක්‍රමිකතා දුරු කිරීමද? විමර්ශනය කරන්න .

8 . ටැසිටස් ඉතිහාසඥයෙකැයි සැලකිය හැක්කේ කුමන පදනමක් මතද? පිළිබඳව ඔබේ අදහස් දක්වන්න .

## දෙවන කොටස- සාහිත්‍යය සිද්ධාන්ත

9 . 'කාව්‍ය සම්බන්ධයෙන් හොරස් දක්වා ඇත් සියලු අදහස් වැදගත් වන්නේ නැත.' මෙම කියමන සමග ඔබ එකග වන්නේද? හොරස්ගේ **ආර්ස් පොයටිකා** ඇසුරින් ඔබේ අදහස් දක්වන්න .

10 . ටැසිටස්ගේ **ඩේ ඔරටෝරේ** හි දැක්වෙන ප්‍රධාන කරුණු පැහැදිලි කරන්න .

11 . යහපත් ශෛලයක තිබිය යුතු ලක්ෂණ පිළිබඳව කුවින්ටිලියන්ගේ අදහස් සාකච්ඡා කරන්න .

සාමාන්‍ය කලා උපාධිය (බාහිර) 2016 අගෝස්තු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය 3

( WCCG 3 ) නව නිර්දේශය

**ග්‍රීක චින්තනය**

කාලය පැය තුනයි

මෙම ප්‍රශ්ණ පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්ණ සංඛ්‍යාව 09 කි.

---

**පළමු ප්‍රශ්ණයටත් එක කොටසකින් අඩුම තරමේ ප්‍රශ්ණ දෙක බැගින් තෝරා ගනිමින් තවත් ප්‍රශ්ණ හතරකටත් පිලිතුරු සපයන්න**

1. පහත දැක්වෙන උපුටා ගැනීම් අතරින් එක් දාර්ශනිකයෙකුගෙන් අවම තරමින් උපුටා ගැනීම් දෙකක් තෝරා ගෙන හතරක් පිළිබඳව ඔබේ අදහස් දක්වන්න .

උපුටා ගැනීම් සඳහා ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රශ්ණ පත්‍රය බලන්න .

## පළමු කොටස - ප්ලේටෝගේ **ජනරජය**

2. තම පරමාදර්ශී රාජ්‍යයේ පාලකයින් වශයෙන් කාන්තාවන් සහ පිරිමින් සම තත්වයේ ලා සැලකීම සම්බන්ධයෙන් ප්ලේටෝ සාර්ථක වී යැයි ඔබ සිතන්නේද? ඔහුගේ **ජනරජය** යන කෘතිය ඇසුරින් සාකච්ඡා කරන්න.

3. ප්ලේටෝ **ජනරජය** කෘතියේ දක්වා ඇති පෙනෙන ලෝකයේ සහ තේරුම් ගත හැකි ලෝකයේ සොභාවය ඒවා ඒකිනෙකට සම්බන්ධව පවතින ආකාරයට අනුව අගයන්නේ කෙසේද? පැහැදිලි කරන්න.

4. ප්ලේටෝ රාජ්‍යයක් ගොඩ නැගීම පුද්ගලයෙකු ගොඩ නැගීමකට සමාන කරන මානසික පදනම විග්‍රහ කරන්න.

5. කලාවන් සම්බන්ධයෙන් ප්ලේටෝ ගේ එදිරිය විශ්ලේෂණය කරන්න.

## දෙවන කොටස - ඇරිස්ටොටල්ගේ **ආචාර ධර්ම**

6. ඇරිස්ටොටල්ගේ අදහසට අනුව ප්‍රීතිමත් මිනිසකු වීමට පුද්ගලයකු තුල තිබිය යුතු සොබාවය / ලක්ෂණ පැහැදිලි කරන්න.

7. සෑම ගුණයකටම නුගුණයන් දෙකකින් සමන්විත වෙයි. ඇරිස්ටොටල් මෙය ඔහුගේ **ආචාර ධර්ම** කෘතියේ දක්වන්නේ කෙසේද? සාකච්ඡා කරන්න.

8. සංයමය සහ කාමුක බව පිළිබඳව ඇරිස්ටොටල්ගේ අදහස් විමසන්න .

9. **ඉයුඩයිමෝනියා** තත්වයට (විශිෂ්ට වූ ප්‍රීතියට) පත්වීම සඳහා දායක වන ආකාරය පිළිබඳ ව දක්වමින් මිත්‍රත්වය (ෆීලියා) පිළිබඳව ඇරිස්ටොටල්ගේ අදහස් පැහැදිලි කරන්න.

සාමාන්‍ය කලා උපාධිය (බාහිර) 2016 අගෝස්තු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය 1

( WCCG3 B ) පැරණි නිර්දේශය

**ග්‍රීක දර්ශනය**

කාලය පැය තුනයි

මෙම ප්‍රශ්ණ පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්ණ සංඛ්‍යාව 10 කි.

---

ප්‍රශ්ණ **පහකට** පිළිතුරු සපයන්න .

1. 'තේලීස් යනු ප්‍රථම ග්‍රීක දාර්ශනිකයා ය.' ඔබ මෙම කියමන සමග එකග වන්නේද? ඔබේ පිලිතුර සඳහා හේතු දක්වන්න.

2. විශ්වයේ මූල ධාතු සම්බන්ධයෙන් වන ඇනැක්සිමැන්ඩර්ගේ සහ ඇනැක්සිමිනිස්ගේ අදහස් විශ්ලේෂණය කරන්න.

3. 'හෙරක්ලිටස්ගේ ලෝක විස්තරයේ ගින්දර විශ්වයේ මූලික ස්වරූපයේ සංකේතය මිස මූල ධාතුවක් නොවේ.' මෙම කියමන සම්බන්ධයෙන් ඔබේ අදහස් දක්වන්න.

4. එම්පෙඩොක්ලීස්ගේ ලෝක විස්තරයේ ප්‍රේමය සහ වෛරය පිළිබඳ සංකල්ප සාකච්ඡා කරන්න.

5. පයිතගෝරස්ගේ පුනරුප්පත්තිය පිළිබඳ සිද්ධාන්තය ආත්මයේ නිදහස් වීම ඇසුරින් **පිරික්සන්න** .

6. විශ්වයේ ආරම්භය පිළිබඳව ඇනැක්සගෝරාස්ගේ අදහස සාකච්ඡා කරන්න.

7. චලනයේ හැකියාවට විරුද්ධව සීනෝ ගෙනෙන තර්කයන් මොනවාද? පැහැදිලි කරන්න .

8. 'පරමාණුවලට හැඩයක් සහ ප්‍රමාණයක් තිබුණද මේවායින් ජනිත වන දේවලට වෙනස් ලක්ෂණ ඇත.' මේ සම්බන්ධයෙන් වන ඩිමොක්‍රිටස්ගේ පැහැදිලි කිරීම විමසන්න .

9. පුරාණ ග්‍රීසියේ පහළ වූ විශිෂ්ටතම විතණ්ඩවාදියා සොක්‍රටීස් වේ.' මෙම කියමන සමග ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

10. ප්ලේටෝගේ ආකෘති පිළිබඳ සිද්ධාන්තය විමසීමට ලක් කරන්න.